චක්‍රලේඛ අංක 1/2001/නොතාරිස්

මගේ අංකය: නො2/9/චංදේ/2001
නොතාරිස් අංශය,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 340, ආර්.ඒ.ද මැල් මාවත,
කොළඹ 03.
2001...12...24... දින.

සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් වෙත.

**ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ (117 වන පරිච්ඡේදය) 29 වන වගන්තිය යටතේ සාමාන්‍ය චංචල දේපල පොර්ණය වෙළුඳ බඩු තොගවලට අදාල ලියවිලි ලියාපදිංචි කිරීම**

උක්ත කරුණට අදාලවඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල වෙත ලියාපදිංචි කිරීම සඳහා ම'විසින් යවනු ලබන චංචල දේපල ඔප්පුවලට අදාල උපදෙස් පත්‍රිකා කෙරෙහි ඔබගේ විශේෂ අවධානය යොමු කරනු කැමැත්තෙමි.

02. ඔබ වෙත එවනු ලබන උපදෙස් පත්‍රිකා ලියාපදිංචි කර ආපසු එවීම ප්‍රමාද වන බව පෙනේ. තවද සමහර කාර්යාලවලට යවනු ලබන උපදෙස් පත්‍රිකා ආපසු නොලැබෙන අවස්ථාද ඇත.

03. එබැවින් මා වෙත එවනු ලබන ඔප්පු ලියාපදිංචි කර ආපසු අදාල ආයතන වෙත යැවීමට නොහැකි තත්ත්වයන් උදාවී ඇති අතර, ඔවුන් විසින් කරනු ලබන විමසීම් වලදීද, මා මහත් අපහසුතාවයකට පත්වන අවස්ථා ඇත.

04. මෙම තත්ත්වය මගහරවා ගැනීම සඳහා මින් ඉදිරියට ඔබ වෙත ලියාපදිංචි කිරීම සඳහා එවනු ලබන උපදෙස් පත්‍රිකා කෙරෙහි ඔබගේ විශේෂ අවධානය යොමු කර ඊට ප්‍රමුඛත්වයක් දී ඒවා ලියාපදිංචි කර එවීමට කටයුතු කරන ලෙස ද මෙතෙක් ඔබ වෙත එවා, ලියාපදිංචි නොකර ඇති උපදෙස් පත්‍රිකා ඇතොත් ඒවා වහාම ලියාපදිංචි කර එවීමට කටයුතු කරන මෙන් දන්වනු අතර, මින් ඉදිරියට ඉහත උපදෙස් පරිදි කටයුතු කරන මෙන් ඉල්ලමි.

05. මින් ඉදිරියේදී එවැනි ප්‍රමාද ඇතිවුවහොත් ඒ ගැන වගකිවයුතු වන නිලධාරියාගේ හෝ නිලධාරිනියගෙන් නිදහසට කරුණුවිමසා විනයානුකූලව කටයුතු කිරීමට සිදුවන බවද විශේෂයෙන් සඳහන් කරනු කැමැත්තෙමි. කරුණාකර මෙම චක්‍රලේඛය ලද බව දන්වන්න.

ලැ.හේ.පී.ද සිල්වා
නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්
රෙජිස්ට්‍රාර් ජනරාල් වෙනුවට.

පිටපත: සියළුම කලාප භාර සහකාර රෙජිස්ට්‍රාර් වරුන්වෙත
(ඔබ කලාපය තුල පිහිටි ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාල පිළිබඳව සොයා බලා අවශ්‍ය කටයුතු කඩිනම් කිරීම සඳහා)